දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/03-05/04/2017

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2021.11.24

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 02/2021

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ නොකිරීම මත උසස්වීම් නොලබා විශ්‍රාම ගිය නිලධාරීන් සඳහා ශ්‍රේණි උසස්වීම් ලබාදීම.</u>**

2007.07.01 දින හෝ ඊට පසු රාජ්‍ය සේවයේ තනතුරකට පත්කරනු ලැබ, අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ නොකිරීම මත ශ්‍රේණි උසස්වීම් නොලබා 2019.08.27 දින හෝ ඊට පෙර රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇති රාජ්‍ය නිලධාරීන් හට සහනයක් ලබාදීමේ අරමුණින් පහත සඳහන් පරිදි කටයුතු කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබාදී ඇත.

02. ඒ අනුව, සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටි වල දක්වා ඇති ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීම සඳහා වන රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සපුරා තිබීම හැර අනෙකුත් අවශ්‍යතාවයන් සපුරා ඇති නිලධාරීන් සඳහා එම නිලධාරීන් විශ්‍රාම ගිය දිනට පෙර දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව අදාළ ශ්‍රේණි උසස්වීම ලබා දීමට හා එම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප, හිඟ වැටුප් නොගෙවීමට යටත්ව සකස් කිරීමට අදාළ පත්වීම් බලධරයන් විසින් කටයුතු කළ යුත්තේය.

i. මෙම සහනය පූර්වපාදු ප්‍රමාණය සලකා සිදුකරනු ලබන බඳවා ගැනීමක් හෝ උසස්වීමක් සඳහා අදාළ කරගත නොහැකිය.
ii. අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ නොකිරීම මත මේ දක්වා අහිමිවී තිබූ වෙනත් උසස්වීමක් හෝ ප්‍රතිලාභයක් මෙම සහනය ලබාදීමේ හේතුව මත නැවත ලබාගත නොහැකිය.

03. ඉහත සදහන් නියමයන් පරිදි අදාළ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස්වීම් ලබාදීමට සුදුසු වැඩපිලිවෙලක් අදාළ පත්වීම් බලධරයන් විසින් සකස් කර ගත යුතු අතර මෙහි සදහන් නියමයන් සම්බන්ධයෙන් ගැටළුවක් ඇතිවන සෑම අවස්ථාවකදීම ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ලබාගැනීමට කටයුතු කල යුත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,



එම්.ඒ.බී.දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව